ඔබේ අංකය / உமது இல / Your No.
මගේ අංකය / எனது இல / My No. } RG/ND/01/04
දුරකථන අංක / தொலைபேசி இல / Telephone Nos } 2888488 / 2889489
ෆැක්ස් / தொலைநகல் / Fax No } 2889491 / 2889492
විද්‍යුත් තැපෑල / மின்னஞ்சல் / E-mail } rgd@sltnet.lk

**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව**
பதிவாளர் நாயகம் திணைக்களம்
REGISTRAR GENERAL'S DEPARTMENT

ප්‍රධාන කාර්යාලය
தலைமை அலுவலகம்
HEAD OFFICE

වෙබ් අඩවිය / இணைய தளம் / Web Site } www.rgd.gov.lk

තැ.පෙ.අංකය. / த.பெ.இல. / P.O.Box No.

234/ඒ3
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත
බත්තරමුල්ල.
234/ஏ3 டென்சில் கொப்பேகடுவ
மாவத்தை. பத்தரமுல்ல
234/A3
Densil kobbakaduwa Mawatha
Battaramulla

දිනය/திகதி/Date 2013.01. 8

චක්‍රලේඛ අංක: 01/2013

සියලුම ඉඩම් රෙජිස්ට්‍රාර්වරුන් වෙත

## 2013 අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම

## ලේඛණ ලියා පදිංචි කිරීම, සහතික පිටපත් නිකුත් කිරීම සහ සෙවීම සඳහා ගාස්තු අයකිරීම

උක්ත කරුණ සම්බන්ධයෙන් මගේ සමාංක සහ 2012.12.26 දින දරණ චක්‍රලේඛ ලිපියට අමතර වශයෙනි.

ඒ අනුව චක්‍රලේඛයේ සඳහන් ලියවිලි ලියා පදිංචි ගාස්තු අයකිරීමේදී පහත සඳහන් පරිදි කටයුතු කරන්න.

I. කේවියට් තහනම:-

කේවියට් තහනම් පත්‍රයක් වර්ෂ දෙකකට වැඩිවන කාලයක් සඳහා වන විට ලියා පදිංචි කිරීමේ ගාස්තු ගණනය කල යුත්තේ වර්ෂ දෙකෙන් දෙකටය. කේවියට් පත්‍රය දෙපිටකින් ඉදිරිපත්කරනු ලැබුවිට පිටපත් දෙකේම ලියා පදිංචි කිරීමේ සටහන් යොදා අතිරේක පිටපත සඳහා මුදල් අය නොකර ආපසු භාරදිය යුතුය.

සටහන: එසේම දැනටමත් ලියා පදිංචි කිරීම සඳහා දෙපිටපතකින් යුතුව භාරගනු ලබන අනෙකුත් ලේඛණ සඳහා ද අතිරේක පිටපත සඳහා ගාස්තු අය නොකළ යුතුය.

II. රජයේ නිලධාරීන් විසින් ලියා සහතික කරනු ලබන ලේඛණ:-

රජයේ නිලධාරියෙකු විසින් නිල නාමයෙන් ඉදිරිපත් කරනු ලබන ලේඛණ සඳහා ලියා පදිංචි ගාස්තු අය නොකළ යුතුය. එහෙත් ලේඛනයක් ලියා පදිංචි කිරීම සඳහා පුද්ගලිකව නීතිඥයකු මාර්ගයෙන් ඉදිරිපත් කරන්නේ නම් පෙර පරිදිම ලියා පදිංචි කිරීමේ මුද්දර ගාස්තුවට අමතරව රු:100 ක මුදලක් අයකළ යුතුය. රජයේ දීමනා පත්‍ර, අනුප්‍රාප්තිය නම් කිරීම,අවලංගු කිරීම,වැනි සාධන පත්‍ර සඳහා ලියා පදිංචි කිරීමේ ගාස්තු අය නොකළ යුතු වුවත් ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ පනවා ඇති ලියා පදිංචි කිරීමේ ගාස්තු පෙර පරිදි මුද්දරවලින් අයකළ යුතුය. රජයේ ඉඩම් වලට අදාළව නොතාරිස්වරුන් විසින් ලියා සහතික කරනු ලබන බදු ඔප්පු සහ උකස් ඔප්පු සඳහා ලියා පදිංචි කිරීමේ ගාස්තු අයකළ යුතුය.

III. පෙර සඳහන් චක්‍රලේඛයේ දක්වා ඇති ලියා පදිංචි ගාස්තු අය කිරීමේදී කලින් නියම කර ඇති ලියාපදිංචි කිරීමේ ගාස්තු මුද්දර මගින් පෙර පරිදිම අයකළ යුතු අතර, වාර්තා ඉදිරිපත් කිරීමේදී මුද්දර මගින් අයකළ ලියා පදිංචි කිරීමේ ගාස්තු සහ මුදලින් අයකළ ලියා පදිංචි කිරීමේ ගාස්තු වෙන වෙනම අදාළ වාර්තාවේ සඳහන් කල යුතුය.

IV තැපෑලෙන් ලැබෙන ලියවිලි සඳහා ගාස්තු අයකිරීම:-

රෙජිස්ට්‍රාර් ජනරාල් නමින් ලංකා බැංකුව පිටකොටුව ශාඛාවේ පවත්වාගෙන යනු ලබන අංක 7041650 ගිණුමට හෝ වෙනත් ඉඩම් කාර්යාලයකට ලියා පදිංචි කිරීමේ ගාස්තු ගෙවන ලද කුවිතාන්සිය නොමැතිව ලියා පදිංචි කිරීම සඳහා ලේඛණයක් ලද විට අදාල ලියවිලි නියමිත පරිදි දිනපොතට භාරගෙන ලියා පදිංචි ගාස්තු රෙජිස්ට්‍රාර් ජනරාල්ගේ ගිණුමට බැර කර බැංකු රිසිට්පත ඉදිරිපත් කරන ලෙස හෝ ළඟම පිහිටි රෙජිස්ට්‍රාර් කාර්යාලයකට නියමිත ලියා පදිංචි කිරීමේ ගාස්තු ගෙවා කුවිතාන්සිය ඉදිරිපත් කරන ලෙස යවා එම මුදල අයකරගැනීමට කටයුතු කළ යුතුය. සාධාරණ කාලයක් තුළ ලියා පදිංචි කිරීමේ ගාස්තු නොලැබුනහොත් ලේඛණ ලියා පදිංචි කිරීම ප්‍රතික්ෂේප කිරීමට ක්‍රියා කළයුතුය.

V. වෙනත් ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයකට ලියා පදිංචි කිරීමේ ගාස්තු ගෙවන ලද ලේඛණයක් ඉඩම් කාර්යාලයකට ලද විට නියමිත පරිදි දවස්පොතට භාරගෙන දිනපොත් අංකයට අදාළව ලියා පදිංචි ගාස්තු ගෙවා ඇති කාර්යාලයේ නම සටහන් කරමින් සුදුසු සටහනක් දවස්පොතේ වෙනත් කරුණු තීරයේ සඳහන් කළ යුතුය.

V. වෙනත් ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයකට අදාළ ලේඛණයක් භාරගනු ලැබූ අවස්ථාවකදී අදාළ ලේඛණය නියමිත ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලය වෙත ලියා පදිංචි තැපෑලෙන් යැවිය යුතු අතර අදාළ ලේඛණය ලියා පදිංචි තැපෑලෙන් යැවූ බවට දන්වමින් ලියා පදිංචි තැපැල් අංකයද සඳහන් කරමින් ඒ බව ලේඛණය දින පොතට භාරදුන් අය වෙත දන්වා යැවිය යුතුය.

02. වෙනත් ඉඩම් ලියා පදිංචි කාර්යාලවලට අදාළ ඔප්පු වෙනුවෙන් ලියා පදිංචි කිරීමේ ගාස්තු භාරගැනීම:

I. කිසියම් නොතාරිස්වරයකු විසින් හෝ පාර්ශවකරුවකු විසින් වෙනත් ඉඩම් කාර්යාලයකට අදාළ ලේඛණයක් සම්බන්ධයෙන් ලියා පදිංචි කිරීමේ ගාස්තු භාරගන්නා ලෙස ඉල්ලා සිටියහොත් එවැනි අවස්ථාවකදී නියමිත ලියා පදිංචි කිරීමේ ගාස්තු භාරගෙන ඒ සඳහා කුවිතාන්සියක් නිකුත් කළ යුතුය. එසේ වෙනත් ඉඩම් කාර්යාලයකට ගෙවන ලද කුවිතාන්සියක් සමඟ ලේඛණය ලියා පදිංචි කිරීම සඳහා නියමිත ඉඩම් කාර්යාලයට ලද විට ඉහත V කරුණ යටතේ සඳහන් කර ඇති පරිදි ක්‍රියා කළ යුතුය.

II. තම බලප්‍රදේශයේ සිටින නොතාරිස්වරුන් වෙත වෙනත් ඉඩම් කාර්යාලයකට ලේඛණය ලියා පදිංචි සඳහා තැපෑලෙන් යැවීමට අදහස් කරන්නේ නම් ඒ සඳහා තම කාර්යාලයට ලියා පදිංචි කිරීමේ ගාස්තු පහසුකම් සළසා ඇති බව හා රෙජිස්ට්‍රාර් ජනරාල්ගේ අංක 7041650 දරණ ගිණුමට මුදල් ගෙවිය හැකි බව දන්වා යැවීමට පියවර ගන්න.

03. ඉඩම් ලේඛණ පරීක්ෂා කිරීම සහ පත් ඉරු සඳහා ගාස්තු:

I. එක් ඉඩමකට අදාළව ලේඛණ පරීක්ෂා කිරීමට ලේඛණ සැපයීමේදී නියමිත ඉඩමට අදාළව ලේඛණ ...